ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

# පෙරහුරු පරීක්ෂණය - 2023(2024)

11 ශ්‍රේණිය | බුද්ධ ධර්මය - I | කාලය: පැය 01 යි.

සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01. සිදුහත් බෝසතාණන් වහන්සේ "සත්‍ය ගවේෂීව" සිටි සමයේ උන් වහන්සේට මුණ ගැසුණු අෂ්ට සමාපත්තිලාභීව සිටි තවුසාගේ නම කුමක් ද?
1. භග්ගව 2. කාලදේවල 3. ආලාරකාලාම 4. උද්දකරාමපුත්ත

02. ආනන්දයෙනි, මේ රජගහනුවර සිත් අලවන සුලුය. එසේම නිග්‍රෝධය සිත්කලුය. චෞර ප්‍රපාතය සිත්කලුය. යනාදී ප්‍රකාශය තුළින් කියැවෙන්නේ,
1. වස් විසූ ස්ථාන පිළිබඳවය.
2. පාරිසරික සුන්දරත්වය ඇගයීමට ලක් කළ ස්ථාන පිළිබඳව ය.
3. සක්මන් කිරීම සඳහා භාවිතා කළ ස්ථාන පිළිබඳව ය.
4. සරාගී බව වඩවන ස්ථාන පිළිබඳව ය.

03. මට්ටකුණ්ඩලී, රජ්ජුමාලා වැනි අයට පිහිට වීමෙන් ප්‍රකට වූයේ,
1. ගිලානෝපස්ථාන ගුණයයි. 2. අසරණ සරණ ගුණයයි.
3. සහනශීලී ගුණයයි. 4. අකම්ප්‍ය ගුණයයි.

04. "රහසත් පව් නොකොට - කෙලෙසරයනුන් දුරු කොට" මෙම කවි දෙපදයෙන් කියැවෙන්නේ බුදුරජාණන් වහන්සේ තුළ පැවති කිනම් බුදු ගුණය ද?
1. සම්මා සම්බුද්ධ 2. අරහං 3. ලෝකවිදූ 4. සුගත

05. නිවන් පසක් කිරීමට අවශ්‍ය වන මහා පිළිවෙත් රකින බැවින් සඟරුවන,
1. සුපටිපන්න නම් වේ. 2. උජුපටිපන්න නම් වේ.
3. ඤායපටිපන්න නම් වේ. 4. සාමීචිපටිපන්න නම් වේ.

06. ප්‍රතිසන්ධිය ලබා දීමට ඉවහල් වන කර්මය වන්නේ,
1. ජනක කර්මයයි. 2. උපත්ථම්භක කර්මයයි.
3. උපපීඩක කර්මයයි. 4. උපඝාතක කර්මයයි.

07. දුගී පවුලක උපත ලැබුව ද ඉහළ මට්ටමේ රූප ශෝභාව හේතුවෙන් වාසනාවන්ත ජීවිතයක් ගත කිරීමට අවස්ථාව උදාවිය හැක්කේ,
1. උපධි සම්පත්තියෙනි. 2. කාල සම්පත්තියෙනි.
3. ප්‍රයෝග සම්පත්තියෙනි. 4. ජාති සම්පත්තියෙනි.

08. ත්‍රිවිධ රත්නය පිළිබඳ කරුණු දැන, ඇති කර ගන්නා පැහැදීම,
1. අමූලිකා ශ්‍රද්ධාව නම් වේ. 2. [illegible] නම් වේ.
3. අවෙච්චප්පසාදය නම් වේ. 4. [illegible] නම් වේ.

09. අනුන්ගේ යහපත හා දියුණුව පිණිස කටයුතු කිරීම,
1. අර්ථ චර්යාවයි. 2. සමානාත්මතාවයයි. 3. [illegible] 4. [illegible]

10. මොග්ගලීපුත්ත තිස්ස මහ රහතන් වහන්සේ විසින් සම්පාදනය කොට අභිධර්ම පිටකයට එක් කරනු ලැබුයේ,
   1. පට්ඨානප්පකරණයයි.
   2. යමකප්පකරණයයි.
   3. විභංගප්පකරණයයි.
   4. කථාවත්ථුප්පකරණයයි.

11. මහින්දාගමනයේ ප්‍රතිඵලයක් වශයෙන් සැලකිය හැකි කරුණක් නොවන්නේ,
   1. දේශීය භික්ෂු සමාජය ආරම්භ වීමය.
   2. මහා විහාරය කේන්ද්‍රකර ගත් අධ්‍යාපනයක් ඇරඹීමය.
   3. රාජ්‍ය පාලනය භික්ෂූන් යටතට ගැනීමය.
   4. කැටයම් හා මූර්ති කලාවක් බිහි වීමය.

12. "මාගේ මේ ව්‍යායාමය බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිස මිස කිසි කලෙකත් රජ සැප පිණිස නොවන්නේ ය." මේ සටන් පාඨය පෙරදැරි කර ගෙන කටයුතු කළ පාලකයා කවුද?
   1. වළගම්බා මහ රජතුමා
   2. ධාතුසේන මහ රජතුමා
   3. මහ පැරකුම්බා මහ රජතුමා
   4. දුටුගැමුණු මහ රජතුමා

13. පන්සිය පනස් ජාතක පොත් වහන්සේ ලියැවුණේ,
   1. පොළොන්නරු යුගයේ දී ය.
   2. දඹදෙණි යුගයේ දී ය.
   3. කුරුණෑගල යුගයේ දී ය.
   4. අනුරාධපුර යුගයේ දී ය.

14. අනාබද්ධ බුද්ධ ප්‍රතිමාවකට නිදසුනක් වන්නේ,
   1. අවුකන බුද්ධ ප්‍රතිමාවයි.
   2. මාළිගාවිල බුද්ධ ප්‍රතිමාවයි.
   3. තොළුවිල බුද්ධ ප්‍රතිමාවයි.
   4. සැස්සේරුව බුද්ධ ප්‍රතිමාවයි.

15. ආමලාකාර දාගැබක ගර්භයේ ස්වරූපය අනුව එය,
   1. නෙළුමක හැඩය ගනී.
   2. නෙල්ලි ගෙඩියක හැඩය ගනී.
   3. කළයක හැඩය ගනී.
   4. සීනුවක හැඩය ගනී.

16. "සම්බුදු සසුන බේරා ගැනීමට තවත් විසිපස් වතාවක් මේ දඹදිව ඉපදේවා" යන ප්‍රාර්ථනය කළේ කවුද?
   1. හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා ය.
   2. රේරුකානේ චන්දවිමල මහ නාහිමි ය.
   3. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් ය.
   4. ශ්‍රීමත් අනගාරික ධර්මපාල තුමා ය.

17. පරලොවක් නැත යන පිළිගැනීම මත මෙලොව වශයෙන් හැකිතාක් සැප විඳීමට ඇති ආශාව,
   1. කාම තණ්හාවයි.
   2. භව තණ්හාවයි.
   3. විභව තණ්හාවයි.
   4. රස තණ්හාවයි

18. බුදුරජාණන් වහන්සේ දෙව්ලොව සිට සංකස්ස පුරයට වැඩම කිරීම චිත්‍රයට නඟා ඇති පොළොන්නරු යුගයට අයත් පූජනීය ස්ථානය කුමක් ද?
   1. හිඳගල විහාරය
   2. දිඹුලාගල ලෙන් විහාරය
   3. තිවංක පිළිම ගෙය
   4. මැදවල විහාරය

19. දැහැමින් උපයාගත් ධනය පරිභෝජනය කළ යුතු ආකාරය පැහැදිලි කරමින් බුදුරජාණන් වහන්සේ "පත්තකම්ම සූත්‍රය" දේශනා කළේ,
   1. උග්ග සිටුතුමාට ය.
   2. අනේපිඬු සිටුතුමා ය.
   3. කොසොල් රජතුමාට ය.
   4. විශාඛා උපාසිකාවට ය.

20. බුදුරජාණන් වහන්සේගේ රූපසම්පත්තිය දැක උන්වහන්සේ අනුගමනය කිරීමට යොමු වූ භික්ෂුව කවුද?
   1. අනුරුද්ධ හිමි.
   2. ආනන්ද හිමි
   3. ධම්මාරාම හිමි
   4. වක්කලී හිමි

21. "දානං සීලං ච නෙක්ඛම්මං" යන ගාථාවෙන් විස්තර වන්නේ,
1. දස පාරමිතා පිළිබඳව ය.
2. දස රාජධර්ම පිළිබඳව ය.
3. දස සක්විතිවත් පිළිබඳව ය.
4. දස පින් කිරියවත් පිළිබඳව ය.

22. සම්මා සම්බුද්ධ පච්චේක බුද්ධ, අරහත්ත බුද්ධ යන තුන් ආකාරයට සත්‍ය අවබෝධ කරන බව ධර්මයේ දැක්වේ. එම තුන් ආකාරය,
1. තුන්තරා බෝධිය නම් වේ.
2. ත්‍රිවිධ චෛත්‍ය නම් වේ.
3. ත්‍රිවිධ රත්නය නම් වේ.
4. ත්‍රිශික්ෂා නම් වේ.

23. දාන පරමත්ථ පාරමිතා යනුවෙන් හැඳින්වෙන්නේ,
1. තමා සතු භෞතික දෑ දන්දීමයි.
2. ශරීර අවයව දන්දීමයි.
3. අඹු දරුවන් දන්දීමයි.
4. තම ජීවිතය දන්දීමයි.

24. යමක් ආරම්භ කිරීමේ දී, ඉදිරිපත් වීමේ දී හා නිරත වීමේ දී නොපසුබස්නා උත්සාහයෙන් කටයුතු කිරීමේ වටිනාකම විස්තර වන්නේ,
1. සත්‍ය පරාමිතාවෙනි.
2. නෙක්ඛම්ම පාරමිතාවෙනි.
3. අධිෂ්ඨාන පාරමිතාවෙනි.
4. වීර්ය පාරමිතාවෙනි.

25. සතර සංග්‍රහ වස්තුවට අයත් නොවන කරුණ වන්නේ,
1. දානය යන්නයි.
2. සීලය යන්නයි.
3. ප්‍රිය වචනය යන්නයි.
4. සමානාත්මතාවය යන්නයි.

26. පළමුවන ධර්ම සංගායනාවේ මූලිකත්වය ගෙන ක්‍රියා කළේ,
1. සබ්බකාමී තෙරණුවෝ ය.
2. මොග්ගලීපුත්ත තිස්ස තෙරණුවෝ ය.
3. මහා කාශ්‍යප තෙරණුවෝ ය.
4. පාර්ශ්ව තෙරණුවෝ ය.

27. තමාට හැකියාව තිබියදීත් මහළු වියට පත් මව්පියන්ට නොසැලකීමේ ආදීනව දැක්වෙන සූත්‍ර දේශනාව,
1. මංගල සූත්‍රයයි.
2. පරාභව සූත්‍රයයි.
3. සිඟාලෝවාද සූත්‍රයයි.
4. පත්තකම්ම සූත්‍රයයි.

28. බුදුරජාණන් වහන්සේගේ දකුණු අකු ධාතුව නිධන් කොට දෙවන පෑතිස් රජතුමා ගොඩ නැඟූ ස්තූපය වන්නේ,
1. මහියංගන චෛත්‍යයයි.
2. ථූපාරාම දාගැබයි.
3. ගිරිහඬු සෑයයි.
4. රන්කොත් වෙහෙරයි.

29. මහනුවර රාජධානි යුගයට අයත් සිතුවම් දක්නට ලැබෙන ස්ථානය වන්නේ,
1. හිඳගල විහාරයයි.
2. ගල් විහාරයයි.
3. තිවංක පිළිමගෙයයි.
4. මැදවල විහාරයයි.

30. තමා උපමා කොට අනුන් ගැන සිතන්නට උගන්වන "ධම්ම පරියාය" බුදු දහමේ හැඳින්වෙන්නේ,
1. ලෝකාධිපති ධම්ම ලෙසය.
2. අත්තාධිපති ධම්ම ලෙසය.
3. ධම්මාධිපති ධම්ම ලෙසය.
4. අත්තූපනායික ධම්ම ලෙසය.

31. දිගු කලක් නැවත නැවත කිරීමෙන් ප්‍රබලත්වයට පත්වන චේතනා පෙරටු කරගත් ක්‍රියා හෙවත් කුසලා කුසල කර්ම ධර්මයේ හැඳින්වෙන්නේ කුමන නමකින් ද?
1. වේදනා
2. සඤ්ඤා
3. සංඛාර
4. විඤ්ඤාණ

32. බුද්ධත්වය ප්‍රාර්ථනා කරන බෝසත් උතුමන් විසින් පුරනු ලබන උතුම් පිළිවෙත් සමූහය,
1. දස කුසලධර්ම නම් වේ.
2. දස සීල නම් වේ.
3. දස පාරමිතා නම් වේ.
4. දස පුණ්‍ය ක්‍රියා නම් වේ.

33. බුදුරජාණන් වහන්සේට ද, ධර්මයට ද, සංඝ රත්නයට ද අගුණ කියමින් හා ගුණ කියමින් පැමිණි පරිබ්‍රාජකයා හා අන්තේවාසිකයා පිළිවෙලින් කවරහු ද?

1. බ්‍රහ්මදත්ත හා සුප්‍රබුද්ධ
2. සුප්පිය හා බ්‍රහ්මදත්ත
3. සුප්පිය හා ඉසිදත්ත
4. සුප්පිය හා සෝණදණ්ඩ

34. බුදුරජාණන් වහන්සේ විසින් රෝග වැළදීමට හේතු අටක් දේශනා කළේ කිනම් භික්ෂූන් වහන්සේ අරභයා ද?

1. ගිරිමානන්ද හිමි
2. ආනන්ද හිමි
3. මහා කාශ්‍යප හිමි
4. මහා මුගලන් හිමි

35. "නැවත සසරට එකතු නොවීම නිසා උපතක් සිදු නොවේ" යන්න සඳහන් වන පටිලෝම පටිච්ච සමුප්පාද ඉගැන්වීම වන්නේ,

1. භව නිරෝධා ජාති නිරෝධෝ යන්නයි.
2. උපාදාන නිරෝධා භව නිරෝධෝ යන්නයි.
3. තණ්හා නිරෝධා උපාදාන නිරෝධෝ යන්නයි.
4. වේදනා නිරෝධා තණ්හා නිරෝධෝ යන්නයි.

36. ධාර්මිකව උපයා සපයා ගත් ධනයක් ඇතැයි සිතා යමෙක් සතුටක් ලබන්නේ නම් එය,

1. අත්ථි සුඛය නම් වේ.
2. භෝග සුඛය නම් වේ.
3. අනනජන සුඛය නම් වේ.
4. අනවජ්ජ සුඛය නම් වේ.

37. බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වන පරිදි නැගිට ගැනීමටවත් බැරි තරමට කෑම ගෙන එහිම පෙරළී සිටින්නා,

1. කාකමාසක නම් වේ.
2. භුත්ත වමික නම් වේ.
3. තත්ථාවට්ටක නම් වේ.
4. ආහර හත්ථක නම් වේ.

38. රටවැසියන් වශයෙන් ගෙවිය යුතු බදු මුදල් බුදු දහමේ හඳුන්වන්නේ,

1. රාජ බලි නමිනි.
2. අතිථි බලි නමිනි.
3. දේවතා බලි නමිනි.
4. පුබ්බපේත බලි නමිනි.

39. ගුරුවරුන්ට සවන් දීමෙන්, පොතපත කියවීමෙන් නුවණ දියුණු කර ගැනීම ධර්මයේ හැඳින්වෙන්නේ,

1. චින්තාමය ප්‍රඥා නමිනි.
2. සුතමය ප්‍රඥා නමිනි.
3. භාවනාමය ප්‍රඥා නමිනි.
4. ඉන්ද්‍රියමය ප්‍රඥා නමිනි.

40. "මොලොක් සහ තෙත් ගතියෙන් යුතුව ජනතා ගැටලු වලට විසඳුම් ලබා දීම" දසරාජධර්ම වල හැඳින්වෙන්නේ,

1. සීලය නමිනි.
2. ඍජු බව නමිනි.
3. මෘදු බව නමිනි.
4. තපස නමිනි.

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

# පෙරහුරු පරීක්ෂණය - 2023(2024)

19813

| 11 ශ්‍රේණිය | බුද්ධ ධර්මය - II | කාලය: පැය 02 යි. |
|---|---|---|

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 04 ට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් හා අනෙකුත් ප්‍රශ්න සඳහා ලකුණු 10 බැගිනි.

(1). (i). ත්‍රිවිධ චෛත්‍යය නම් කරන්න.
(ii). "සමණාමයං මහාරාජ" .................. යන ගාථාව ලියන්න.
(iii). සතර ඍද්ධිපාද අතුරින් 2 ක් ලියන්න.
(iv). පංච මහා විලෝකනයෙන් දෙකක් නම් කරන්න.
(v). තේමිය ජාතකය ප්‍රකට වන්නේ බෝසතාණන් වහන්සේගේ කිනම් පාරමිතාවක් ද?
(vi). සතර සතිපට්ඨානයෙන් දෙකක් ලියන්න.
(vii). උපතිස්ස කෝලිත දෙදෙනාගේ පැවිදි කළ නම් අනුපිළිවෙළින් ලියා දක්වන්න.
(viii). ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ සඳහන් මෙලොව දියුණුවට හේතුවන කරුණු 4 ලියන්න.
(ix). සිදත් සඟරාව සහ සිංහල බෝධි වංශය නැමැති කෘති අයත් වන යුගයන් වෙන වෙනම පිළිවෙළට ලියන්න.
(x). මහියංගනය ස්තූපය සහ කැළණි ස්තූපවල නිර්මාණාත්මක ආකෘතිය (හැඩය) නම් කරන්න.

(2). (i). "චිත්තං සමේතිති සාමථෝ" යන්නෙහි තේරුම ලියන්න.
(ii). විදර්ශනා භාවනාවේ ප්‍රයෝජන තුනක් නම් කරන්න.
(iii). සමථ භාවනාව පුරුදු පුහුණු කිරීමෙන් ශිෂ්‍යයෙකු ලෙස ඔබට අත්වන යහපත පිළිබඳ ඇගයීමක් කරන්න.

(3). (i). බෞද්ධයාගේ අත්පොත ලෙස සැලකෙන්නේ කිනම් ග්‍රන්ථයක් ද?
(ii). "සුකරානි අසාධූනි" .................. යන ධම්ම පද ගාථාව සම්පූර්ණ කරන්න.
(iii). පුද්ගලයා වරදින් මුදවා සුචරිතයෙහි යෙදවීම සඳහා ධම්මපදයෙන් ලැබිය හැකි ආදර්ශය අගය කරන්න.

(4). (i). පාරමිතා යනු කුමක්දැයි කෙටියෙන් පහදන්න.
(ii). පාරමිතා පිරීමේදී අත්හළ යුතු කරුණු තුන නම් කරන්න.
(iii). දස පාරමිතා ගුණ ධර්ම අතරින් ප්‍රඥා, වීර්යය, අධිෂ්ඨාන යන ගුණ ධර්ම දිවියේ දියුණුවට යොදා ගත හැකි අයුරු පැහැදිලි කරන්න.

(5). (i). ප්‍රථම සංගායනාව පැවැත්වූ ස්ථානය හා එයට සහභාගි වූ පිරිස් කොපමණ දැයි සඳහන් කරන්න.
(ii). එම ධර්ම සංගායනාවේ ප්‍රතිඵල තුනක් ලියන්න.
(iii). බුද්ධ ශාසනයේ පැවැත්මට ධර්ම සංගායනා තුළින් සිදු වූ සේවාව ඇගයීමට ලක් කරන්න.

(6). (i). දසරාජ අතරින් දෙකක් නම් කරන්න.
(ii). ඉන් එකක් කෙටියෙන් හඳුන්වන්න.
(iii). වර්තමාන රාජ්‍ය තුළ පවතින ජනතා ගැටළු විසඳීමටත්, දැහැමි රාජ්‍යයක් ගොඩනගා ගැනීමටත් දසරාජ ධර්ම පාලකයන්ට වැදගත් වන අයුරු පැහැදිලි කරන්න.

(7). පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට කෙටි සටහන් ලියන්න.
(i). අසරණ සරණ සිරි සරණංකර සංඝරාජ හිමි
(ii). කල්‍යාණ මිත්තතාව
(iii). සිවබඹ විහරණ
(iv). වටදාගෙය

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

**පෙරහුරු පරීක්ෂණය - 2023(2024)**

| **11 ශ්‍රේණිය** | **බුද්ධ ධර්මය** | |
|---|---|---|

## පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (01) | 4 | (11) | 3 | (21) | 1 | (31) | 3 |
| (02) | 2 | (12) | 4 | (22) | 1 | (32) | 3 |
| (03) | 2 | (13) | 3 | (23) | 4 | (33) | 2 |
| (04) | 2 | (14) | 2, 3 | (24) | 4 | (34) | 1 |
| (05) | 1 | (15) | 2 | (25) | 2 | (35) | 1 |
| (06) | 1 | (16) | 4 | (26) | 3 | (36) | 1 |
| (07) | 1 | (17) | 3 | (27) | 2 | (37) | 3 |
| (08) | 3 | (18) | 3 | (28) | 2 | (38) | 1 |
| (09) | 1 | (19) | 2 | (29) | 4 | (39) | 2 |
| (10) | 4 | (20) | 4 | (30) | 4 | (40) | 3 |

## II කොටස

(1). (i). ශාරීරික, උද්දේසික, පාරිභෝගික

(ii). සමණාමයං මහාරාජ - ධම්මරාජස්‍ය ශ්‍රාවකා
තමේව අනුකම්පාය - ජම්බුදීපා ඉදාගතා.

(iii). ඡන්ද, චිත්ත, වීර්යය, විමංසා

(iv). කාලය, දේශය, දීපය, කුලය, මව

(v). ප්‍රඥා පාරමිතාව

(vi). බුද්ධානුස්සති, ධම්මානුස්සති, චිත්තානුස්සති, වේදනානුස්සති

(vii). සැරියුත් - මුගලන්

(viii). 1. උට්ඨාන සම්පදා 2. ආරක්ඛ සම්පදා
3. කළ්‍යාණ මිත්තත 4. සමජීවිකතා

(ix). සිදත් සඟරාව - දඹදෙණි යුගය
සිංහල බෝධිවංශය - කුරුණෑගල යුගය

(x). මහියංගනය - සණ්ඨාගාර
කැළණිය - ධාන්‍යාගාර

(2). (i). විසිරී ඇති සිත එක්තැන් කිරීම සමථයයි.

(ii). අනිත්‍ය බව, අනිත්‍ය පැවතීම.

(iii). ලියා ඇති පිළිතුර අනුව ලකුනු ලබා දෙන්න.

(3). (i). ධම්මපදයයි.

(ii). සුකරානි අසාධූනි - අත්තනො අහිතානිච

යං වේ හිතංච සාධුංච - තං වේ පරම දුක්කරං

(iii). පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු ලබා දෙන්න.

(4). (i). නිවනට පමුණුවන පිළිවෙත් පාරමිතා යනුවෙන් හඳුන්වයි.

පරම යන්නෙන් "උත්තම" යන අර්ථය ද , බුද්ධත්වය ප්‍රාර්ථනා කරන බෝසත් උතුමන් විසින් පුරණු ලබන උතුම් පිළිවෙත් පාරමිතා යන්න ද වේ.

(ii). 1. තණ්හාව 2. මානය 3. මිථ්‍යා දෘෂ්ඨිය

(iii). පිළිතුර සැසඳීමෙන් ලකුණු ප්‍රදානය කරන්න.

(5). (i). රජගහ නුවර වේභාර පර්වතයේ සප්තපණ්ණි ගල් ගුහාව ද්වාරය අසල.

(ii). රහතන් වහන්සේලා 500 පමණි.

(iii). 1. භාණක පරම්පරාවට වගකීම් පැවරීම.
2. ත්‍රිපිටකය කණ්ඩායම් වශයෙන් බෙදා දැක්වීම.
3. පනවා ඇති විනය නීති එලෙසින්ම ඉදිරියට ගෙන යෑම.
4. විසිරී තිබූ ධර්මය එක්රැස් කර සම්මුතියකට ගෙන ඒම.

(6). (i). සංගායනා තුන පිළිබඳව සඳහන් කර ඇත්නම් සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න.

(ii). කරුණු පිළිබඳ සලකා බලන්න.

(iii). කරුණු 3 ක් පිළිබඳවවත් විස්තර විය යුතුයි.

(7). එක් එක් මාතෘකා යටතේ ලියා ඇති කරුණු සලකා බලා ලකුණු ප්‍රදානය කරන්න.


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න